**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

# පුරප්පාඩු පිළිබඳ දැන්වීම

## දුම්බර හරිත සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය (GCF - Knuckles project )

නකල්ස් කඳුකර කලාපයේ කෘෂිකාර්මික, ග්‍රාමීය සහ වතු ප්‍රජාවන් දේශගුණ විපර්යාසයන්ට අනුගත වීම ශක්තිමත් කිරීමේ අරමුණින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන GCF නකල්ස් ව්‍යාපෘති බලප්‍රදේශය තුළ තිරසාර ඉඩම් කළමනාකරණය හා ප්‍රවර්ධනය කිරීමට ද කැප වී සිටී. මාතලේ, මහනුවර, කුරුණෑගල, පුත්තලම සහ අනුරාධපුරය දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 46ක් ආවරණය වන පරිදි මධ්‍යම, උතුරු මැද සහ වයඹ පළාත් ආශ්‍රිතව පිහිටා ඇති තීරණාත්මක ජල පෝෂක, ගංගා සහ කෘෂිකාර්මික ප්‍රජාවන්ගේ තිරසර පැවැත්ම තහවුරු කිරීම සඳහා ව්‍යාපාතිය මගින් මැදිහත් වේ. එමෙන්ම, GCF, ICRAF, IUCN වැනි ප්‍රධාන පාර්ශවකරුවන් සහ බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සම්බන්ධ කරගනිමින් මහජන සහයෝගිතා ප්‍රවේශයන් හරහා ඉඩම් හා ජල කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම, නව්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණ ස්ථාපිත කිරීම සහ දිගුකාලීන පැවැත්ම සඳහා ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා ද ව්‍යාපෘති දායකත්වය ලබා දීම සිදු කරයි.

GCF මූල්‍ය ප්‍රදානයක් ලෙස ලබා දෙන USD 39.7 හා 9.2 ක දේශීය අරමුදල් මත දිස්ත්‍රික්ක 05 ක 2028 තෙක් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති ඉහත සඳහන් ව්‍යාපෘතියට පහත දැක්වෙන තනතුරු සඳහා සුදුසුකම් සහිත නිලධාරින්ගෙන් පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 01/2019 හි කොන්ත්‍රාත් පදනමින් සේවකයින් බඳවා ගනු ලබන අතර, 01/2019 හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය 03/2016 ට අනුව ගෙවීම් කටයුතු සිදුකරනු ලැබේ. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් 2025 ට අදාලව ව්‍යාපෘති කාර්යමණ්ඩල සඳහා වන ගෙවීම් පිළිබඳ චක්‍රලේඛනය නිකුත් කිරීමෙන් අනතුරුව එහි නියමයන් පරිදි ගෙවීම් සංශෝධන සිදු කරනු ඇත.

**පහත සඳහන් තනතුරු සඳහා දිස්ත්‍රික්ක 03 ක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක සඳහා පහත සඳහන් සුදුසුකම් හා පළපුරුද්ද සහිත ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

| අංකය | PS කාණ්ඩය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | අදාල චක්‍රලේඛනය |
|---|---|---|---|---|
| 01 | PS3 | **ප්‍රසම්පාදන විශේෂඥ** (Procurement Specialist) | 01 | |
| 02 | PS3 | **අධීක්ෂණ සහ ඇගයුම් විශේෂඥ** (Monitoring & Evaluation Specialist) | 01 | |
| 03 | PS4 | **වාරිමාර්ග ඉංජිනේරු** (Irrigation Engineer) | 01 | |
| 04 | PS4 | **අභ්‍යන්තර විගණක** (Internal Auditor) | 01 | |
| 05 | PS5 | **තාක්ෂණික නිලධාරී - වාරිමාර්ග (සිවිල්)** (Technical Officer - Irrigation Civil) | 02 | |
| 06 | PS5 | **සහායක විධායක නිලධාරී/ සංවර්ධන නිලධාරී** (Supportive Executive Officer/Development Officer) | 02 | |
| 07 | PS5 | **පරිපාලන සහයක නිලධාරී** (Admin Supportive Officer) | 01 | |
| 08 | PS5 | **මාධ්‍ය නිලධාරී** (Media Officer) | 01 | |
| 09 | PS5 | **ප්‍රසම්පාදන නිලධාරී** (Procurement Officer) | 01 | |
| 10 | * කාර්ය මණ්ඩල සහයක | **කළමනාකරණ සහකාර** (Management Assistant) | 03 | 06/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය හා 01/2019 කළමනාකරණ සේවා චක්‍රලේඛනය පරිදි |
| 11 | | **ගිණුම් සහකාර** (Accountant Assistant) | 02 | |
| 12 | | **කාර්යාල සහයක** (Office Assistant) | 02 | |

**කලාප කාර්යාලයේ (නාවුල/දිගන/ලග්ගල) ශාඛා.**

| අංකය | PS කාණ්ඩය | තනතුර | පුරප්පාඩු සංඛ්‍යාව | | | අදාල චක්‍රලේඛනය |
|---|---|---|---|---|---|---|
| | | | නා උල | දිගන | ලග්ගල | |
| 01 | PS3 | **ව්‍යාපෘති කළමනාකරු** | 1 | - | - | කළමනාකරණ සේවා චක්‍රලේඛනය 01/2019 |
| 02 | PS5 | **මෙහෙයුම් සහායක නිලධාරී** | 3 | 3 | 3 | |
| 03 | * කාර්ය මණ්ඩල සහයක | **කළමනාකාර සහකාර** | 2 | 2 | 2 | 03/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛනය හා 01/2019 කළමනාකරණ සේවා චක්‍රලේඛනය පරිදි |
| 04 | | **කාර්යාල සහයක** | 1 | 1 | 1 | |

*** සහායක කාර්ය මණ්ඩල තනතුර සඳහා රජයේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටි සලකා බලනු ලැබේ.**

වැඩිදුර තොරතුරු සඳහා, **www.irrigationmin.gov.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.
(ඉහත සඳහන් චක්‍රලේඛය බැලීමට කරුණාකර මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය බලන්න)

එක් එක් තනතුර සඳහා අයදුම්පත් **2025 ජුනි 30 වන දින හෝ ඊට පෙර** ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කළ යුතු අතර, පහත දක්වා ඇති ලිපිනයට ලැබෙන අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන ලද තනතුර සඳහන් කළ යුතුය.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ**
**GCF Knuckles Project**
**10 වන මහල, අංක 500, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,**
**ටී.බී. ජයා මාවත, කොළඹ - 10.**

* කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

දිනය : 2025.06.15